මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/FundManagement/2019
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.12. 02

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

<u>ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් කළමණාකරණය</u>

ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් කළමණාකරණය සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් වරින් වර උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කර ඇති නමුදු විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන යටතේ පවත්නා ව්‍යවස්ථාපිත අරමුදල්, භාර අරමුදල් සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධව නිසි කළමණාකරණයක් සිදු නොවීමෙන් එකී අරමුදල් පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ලබා කර ගැනීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය වී ඇත. ඇතැම් අවස්ථාවල මෙවැනි අරමුදල් අවිධිමත් ලෙස උපයෝජනය කර ඇති බවද පෙනී ගොස් ඇත. මෙම තත්වය නිවැරදි කිරීමට හෝ වලක්වා ගැනීමට, එකී සියලුම මහජන අරමුදල් ස්ථාපිත කර ඇති අරමුණු, විෂය පථයන් හා නීතිමය තත්ත්වයන් යටතේ මැනවින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම පිණිස පහත සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

02. මහජන අරමුදල් පිහිටුවීමට අදාල පාර්ලිමේන්තු පනත්, භාර ඔප්පු, එකඟතා ගිවිසුම්, අමාත්‍ය මණ්ඩල තීරණ හෝ පාර්ලිමේන්තු යෝජනා මගින් එකී අරමුදලේ අරමුණු, විෂය පථය හා අරමුදලේ ක්‍රියාකාරිත්වය සඳහා මැනවින් විධිවිධාන සලසා දී ඇත. එකී විධිවිධාන ප්‍රකාරව අරමුදල්වල පවත්නා මුදල් උපයෝජනය කළ යුතු අතර ඊට පරිබාහිර කාර්යයන් සිදු කිරීම සඳහා අරමුදල්වල පවත්නා මුදල් භාවිතයට නොගත යුතුය. තවද අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල් පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු ය.

03. අරමුදලේ අරමුණු හා විෂය පථයට අනුකූලව කාර්යයන් සිදු කිරීමේදී දැරීමට සිදුවන වියදම් සඳහා පූර්ව අනුමැතියක් අදාල කළමණාකරන මණ්ඩලයෙන්/පාලක මණ්ඩලයෙන් ලබා ගත යුතු ය.

04. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය කළමණාකරණය සඳහා විසර්ජන පනතකින් අනුමත කෙරෙන අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හෝ වියදම් දැරීම රාජ්‍ය මූල්‍ය විනය දැඩි ලෙස පිරිහීමට හේතුවන බැවින් අති විශේෂිත අවස්ථාවලදී හැර අරමුදල් ඇති කිරීමට මහා භාණ්ඩාගාරය ප්‍රතිපත්තියක් වශයෙන් ඉඩ නොදෙන අතර, එසේ ක්‍රියාත්මක කරනු ලබන අරමුදල් රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් අදාළ වන නීතිමය රාමුව තුල ක්‍රියාත්මක වන බව තහවුරු වීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතු ය.

අත්.කලේ./ එස්.ආර්.ආටිගල
ලේකම්
මුදල් අමාත්‍යාංශය.

පී.අල්ගම
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව.

පිටපත.

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති